# අපේ කැපවීම සාධාරණ සමාජයක් ගොඩනැගීම වෙනුවෙනුයි

## අනුර කුමාර දිසානායක

**නායක-ජනතා විමුක්ති පෙරමුණ**



**ජනතා විමුක්ති පෙරමුණේ නව නායක අනුර කුමාර දිසානායක මහතා සමග සන්නස කළ විශේෂ සාකච්ඡාව**

**මම කැමතියි මේ සාකච්ඡාව ඔබ ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයට පත්වීම කියන තැනින් ආරම්භ කරන්න. පක්ෂයේ මේ තෝරාගැනීමට ඔබ සතු යම් සුවිශේෂිතාවක් හේතුවුණාද? නැත්නම් ඊට බලපෑ හේතු මොනවද?**

අපේ පක්ෂයේ කවුරුත් තනතුරු වරප්‍රසාද බලාගෙන වැඩකරන අය නෙවෙයි. අපි හැමදෙනාම මේ පක්ෂයට එන්නේ පැවරෙන වගකීම ඉටුකිරීමට. විශේෂයෙන්ම 1988-89 වකවානුවේ අපි ඉතාමත් පහළ අඩියේ වගකීම්වල නිරතව සිටියා. නමුත් 1994 නැවත දේශපාලනය පටන් ගන්නකොට අපට උසුලාගත නොහැකි වගකීම්වලට උරදෙන්නට අපිට සිද්ධ වුණා. ඒ වගකීම් දැරීමෙන් අපි ලබාගත්ත අත්දැකීම්, පන්නරය මේ වන විට අප සතුව තිබෙනවා.
පක්ෂයේ මධ්‍යම කාරක සභාවට සෝමවංශ සහෝදරයා මගේ නම යෝජනා කළා. එය ඒක මතිකව සම්මත වුණා. පක්ෂය තමයි පවතින අභියෝග ජයග්‍රහණය සඳහා ඒ පිළිබඳ ඇගයීමක් කර නායකත්වයට මා තෝරාගත්තේ. පක්ෂය දකින මගේ ගුණාංග මෙන්ම දුබලතාත් තේරුම් අරගෙන ඒ තීරණය පක්ෂය ගන්න ඇති කියලා මම හිතනවා.

**විපක්ෂයේ ඇතැම් පක්ෂවලට සිය දේශපාලන බලය වර්ධනය කරගැනීමට ඇති නොහැකියාවට හේතුව නායකත්වයේ පෞර්ෂ දුර්වලතා කියන අදහසක් තියන බව පේනවා. ජනතා විමුක්ති පෙරමුණ නායකත්ව වෙනසකට ගියෙත් ඒ අදහසින්ද?**

කාලයක් අපේ රටේ සාම්ප්‍රදායික දේශපාලනය ගොඩනැගිලා තිබුණේ වලව් පැලැන්තිය නියෝජනය කරන මහා මුදල් සම්භාරයක් එක්රැස් කරගත්තු මිනිසුන් දේශපාලන නායකත්වයට තෝරාගන්නා ආකාරයකින්. අපේ රටේ දේශපාලනයේදී පුද්ගල පෞර්ෂත්වය කියන කාරණය අපිට බැහැර කරන්න බෑ. නමුත් අපි හිතනවා ඒක හොඳ ගුණාංගයක් නෙවෙයි කියලා. ජනතාව ගොනුවිය යුත්තේ එක් එක් පුද්ගලයන් වටා නොවෙයි. ඉතිහාසය පුරාවට ජනතාව මේ කාරණය නොසළකා හැර පුද්ගලයන් වටා ගොනුවී තියනවා. එයින් කිසිදු යහපතක් සිදුවී නැහැ. සිදුවී ඇත්තේ තවතවත් රටත් ජනතාවත් අඳුරට අගාධයකට ඇදගෙන යාම විතරයි. පුද්ගලයන් කෙරෙහි තබන විශ්වාසයන්වලට වඩා පක්ෂයක් කෙරෙහි වැඩපිළිවෙළක් කෙරෙහි විශ්වාසය තැබීමයි වැදගත් වන්නේ. අපේ දේශපාලනයේ අරමුණ බවට පත්වෙලා තිබෙන්නේ පක්ෂය සහ පක්ෂයේ වැඩපිළිවෙළ සමාජගත කරීම සහ ඒ පිළිබඳව ජනතා විශ්වාසය තහවුරු කරගැනීම. එහෙත් පුද්ගල සාධකයත් අප කිසිසේත් බැහැර කරන්නේ නැහැ. අපි හිතනවා අපගේ පක්ෂයේ නායක සහෝදරවරු පසුගිය කාලය පුරාවට තමන්ගේ අත්දැකීම්වලින්, භාවිතාවන්ගෙන්, තමන්ට පැවරුණු වගකීම් ඉටු කිරීමෙන් මේ රටත් මේ රටේ ජනතාවත් ගොඩනැගිය හැකි, ඉදිරියට ගෙනයා හැකි නායකයන්ගෙන් සමන්විත ව්‍යාපාරයක් බව අප ඔප්පු කර තිබෙනවා.

**ඔබ පිළිගන්නවා සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ භාවිතාව තුළ පුද්ගල පෞර්ෂය කියන කාරණය නායකත්වයට වැදගත් වන බව. නමුත් ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ සාම්ප්‍රදායික දේශපාලන ගමනක් යන පක්ෂයක් නෙවෙයි. ප්‍රතිපත්ති මත දේශපාලන ගමනක් යන පක්ෂයක්. එවැනි පක්ෂයකට නායකත්වයේ වෙනසකින් හෝ නායකත්වයේ පෞර්ෂයෙන් හෝ ඇති කළ හැකි බලපෑම කවරක්ද යන්න අපැහැදිලියි?**
අපි සකස්කරගන්නා වැඩපිළිවෙළවල් මතවාදයන් ජනතාව වෙත ගෙනයාමේ අභියෝගය තමයි නායක්වයට මූලික වශයෙන් පැවරෙන්නේ. අද අපේ රටේ සියළු ක්ෂේත්‍රවල ජනතාව වෙනසක් අපේක්ෂාවෙන් සිටින්නේ. ගොවියන් ධීවරයන් රාජ්‍ය සේවකයන් ව්‍යාපාරිකයන් තරුණ තරුණියන් නාට්‍යකරුවන් සිනමාකරුවන් මේ හැම කෙනෙක්ම වෙනසක් බලාපොරොත්තුවෙනවා. මාධ්‍යවේදියෙක් හැටියට ඔබත් දන්නවා මේ තියන තත්ත්වයන් තුළ ඔබේ කටයුතු පවා කරගෙන යන්න බෑ කියලා. අනෙක් සියළු ක්ෂේත්‍රයන් මුහුණ දී සිටින තත්ත්වයත් ඒකයි. ඒ නිසා සෑම දෙනා තුළම වෙනසක අවශ්‍යතාව පැණනැගිලා තියනවා. හැබැයි ප්‍රශ්ණයක් තියනවා මේ වෙනස කුමක්ද කියලා. ඒ පිළිබඳ තිබෙන්නේ විවිධ මත. අපිට තියන අභියෝගය තමයි මේ වෙනසට අවශ්‍ය වන්නේ මෙන්න මේ වැඩපිළිවෙළයි කියලා සමාජයට තහවුරු කිරීම. අන්න එතැනදී පක්ෂ නායකත්වයට විශාල කාර්යභාරයක් පැවරෙනවා කියලා අපි විශ්වාස කරනවා.

**ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂයක නායකත්වය සඳහා අවශ්‍ය පරිනත බව සහ ගැඹුරු බව ඔබට නැති බවත් ඔබ දක්ෂ ගැලරියට ඇමතීමට පමණක් බවත් ඇතැම් දේශපාලන විචාරකයන් පවසනවා?**

දේශපාලන ව්‍යාපාරයක සාමාජිකයන් විදිහට අපි පිළිබඳ ආත්ම වර්ණනාවන් හෝ ගුණ ගැයීම් අපි විසින්ම සිදුකරගනු ලබන්නේ නැහැ.
දේශපාලනයේදී එතරම් පහත් අඩියකට වැටෙන්නට අපි සූදානම් නැහැ. අපේ භාවිතයන් තුළ අපි ඕනෑවටත් වැඩිය පෙන්නලා තියනවා පුද්ගලයන් වශයෙන් අපට කළ හැකි දේ කුමක්ද කියන එක. අනෙකාගේ විවේචන පිළිබඳ අපි සැළකිල්ලක් දක්වනවා. නමුත් ඒවා ඒ විදිහටම බාරගන්නට අපි සූදානම් නැහැ. පසුගිය කාලයේ සහ ඉදිරි කාලයේදී අපගේ දේශපාලන භාවිතාවන් විමසා බැලීමෙන් ඔබට ඒ ගැන අදහසක් ලබාගන්නට පුළුවනි. අප දෙස විවේචන සහගත ආකල්පයකින් ක්‍රියාකරන බොහෝ මාධ්‍යවල පවා මේ පිළිබඳ කියැවිලා තියෙන්නේ ඇගයීම් සහගත ලෙස කියන එකයි මගේ නිරීක්ෂණය.

**මේ දිනවල අපි මාධ්‍ය තුළින් දකිනවා ජනතා විමුක්ති පෙරමුණේ ''ඉදිරි දැක්ම'' කියන ලියැවිල්ල ඔබ රටේ ජනමත ප්‍රධානීන් වෙත පිළිගන්වමින් යන ආකාරය. මේ ''ඉදිරි දැක්ම'' සහ පක්ෂයේ මෙතෙක් තිබූ දැක්ම අතර මොනවගේ වෙනසක්ද තියෙන්නෙ?**

සමාජයේ සමහර ස්ථරයන් තුළ ගොඩනැගිලා තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ඇත්ත නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව අපේ සතුරන් විසින් ගොඩනගන ලද මිත්‍යාව. ලංකාවේ දේශපාලන ව්‍යපාරයක් තිබෙනවා නම් දෙපාරක් දැවැන්ත මර්ධනයකට ලක් කළ, එම දේශපාලන ව්‍යාපාරයට එරෙහිව චිත්‍රපට නිෂ්පාදනය කළ, නාට්‍ය කළ, පොත් ලියපු, කවි ලියපු, ...ඒ දේශපාලන ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ. අපිට එරෙහිව අපේ සතුරන් විවිධ ප්‍රභන්ධයන් සමාජය තුළ ගොඩනගල තියනවා. ඒ නිසා අපිට අවශ්‍යව තිබුණා අපේ දැක්ම පිළිබඳ මීට වඩා පුළුල් සාකච්ඡාවක් සමාජයට ගෙනයන්න. ඒ වගේම වර්ථමාන ලෝකයේ තාක්ෂණයේ, විද්‍යාවේ, මිනිස් සිතුම් පැතුම්වල ඇතිවෙච්ච මහා වෙනස්කම් ගණනාවක් තියනවා. ඒ වෙනස්කම් මත තබා අපි වැඩපිළිවෙළක් ඉදිරිපත් කළ යුතුයි කියන අදහසකට ආවා. මෙය එක්තරා ආකාරයකට අපේ දේශපාලන ගමන්මගේ දිගුවක්. නව පැත්තකින් නව තත්ත්වයන්ට ගැලපෙන පරිදි වෙනස්කම් සහිත වැඩපිළිවෙළක්. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා අවශ්‍ය මූලික මූලධර්මයන් මෙහි ඇතුළත් වෙනවා.

**මේ ''ඉදිරි දැක්ම'' ඔබ නායකත්වයට පත්වීමෙන් පසුව සකස් කළ එකක්ද? නැත්නම් කාලයක් තිස්සේ සකස් කරමින් තිබී මේ මොහොතේ එළියට එන එකක්ද?**

පසුගියදා අප පැවැත්වූ හත්වන ජාතික මහ සමුළුවේදී පක්ෂ නායකත්වය වෙනස්වීම පමණක් නොවේ සිදුවුණේ. අපේ මධ්‍යම කාරක සභාව යෝජනා ගණනාවක් සම්මත කරගත්තා. එකක් මධ්‍යම කාරක සභාව පුළුල් කරන්න. දේශපාලන මතය පුළුල් කරන්න. රටේ තැන තැන පැනනගින ජනතා උද්ඝෝෂණ ඒකාබද්ධ කරලා ජනතා සටන් මධ්‍යස්ථානයක් ගොඩනගන්නට. මේ ආණ්ඩුව පවතින්නේ තැනින් තැන එක් එක් අවස්ථාවල ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් පවත්වන ප්‍රෝඩාකාරී මැතිවරණ ප්‍රතිපලවලින්. ඒ නිසා ශක්තිමත් මැතිවරණ පෙරමුණක් ගොඩනැගිය යුතුයි කියන ස්ථාවරයටත් ආවා. ඒ වගේම තමයි අපේ ඉදිරි දැක්ම සාකච්ඡා කර අනුමත කෙරුණේත් හත්වන මහා සමුළුවේදියි. ඉදිරියේදී ඇතිවන සහ කළ යුතු දේශපාලන වෙනස්කම් සම්බන්ධ පුළුල් වැඩපිළිවෙලක කොටසක් තමයි මේ.

**ඉදිරි දැක්ම දිහා බැලුවම පේනවා බොහොම ආකර්ශණීය දේශපාලන පොරොන්දු රාශියක් එහි ඇතුළත්වෙන බව. මෙවැනි පොරොන්දු දීර්ඝ කාලයක් තිස්සේ හැම දේශපාලන පක්ෂයකින්ම වගේ ජනතාවට දෙන පොරොන්දු. මේ පොරොන්දු ඉටු කිරීමේ යාන්ත්‍රණය ගැන ජනතා විමුක්ති පෙරමුණට තියන අදහස මොකක්ද?**

හැට හය අවුරුද්දක් තිස්සේ අපේ රටේ ජනතාවට තියන අත්දැකීම මේක නිසා ඔබටත් එවැනි ප්‍රශ්ණයක් පැනනැගීම සාදාරණයි. නමුත් මේක හුදු

---

සංවාද සටහන සහ ඡායාරූප

**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

---

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com